# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/01/i/පොදු | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.03 14 |

සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>මධ්‍යම රජය විසින් පළාත් සභාව යටතේ නිලධාරීන් කැඳවීම සම්බන්ධ හා නිසි ධූරාවලිය අනුගමනය නොකරමින් චක්‍රලේඛ/ලිපි යොමු කිරීම සම්බන්ධව</u>**

උක්ත මැයෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි නිකුත් කර ඇති, ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/CMA/PRES.CIR හා 2022.03.07 දිනැති ලිපිය හා බැඳේ.

02 එමගින් සියලුම අමාත්‍යාංශ ලේකම්වරු අමතන ලද ජනාධිපති ලේකම්ගේ අංක PS/CSA/00/9/13/99 හා 2021.01.18 දිනැති ලිපිය(ඇමුණුම) කෙරෙහි අවධානය යොමු කර ඇත. එම ලිපිය නිකුත් කිරීමෙන් පසුවද පළාත් සභාවට අදාළ කරුණු සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශ මගින් පවත්වනු ලබන සාකච්ඡා සඳහා නිසි ධූරාවලියෙන් බැහැරව පළාත් සභාවන්ට අදාළ සේවාවන්ට අයත් නිලධාරීන් කැඳවීම සිදු කරන බවත්, එම සාකච්ජාවල දී ඇති කරගනු ලබන එකඟතාවයන් පළාත් සභා බල ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීමේදී ගැටළු සහගත තත්වයක් මතු වන බවත් අවධාරණය කර ඇත.

03 එබැවින් රේඛීය අමාත්‍යාංශ සඳහා පළාත් සභා නිලධාරීන්ට කැඳවීම් ලැබෙන අවස්ථාවල දී ඒ සම්බන්ධයෙන් මා දැනුවත් කර, මා මගින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන අදාළ සාකච්ජා සඳහා සහභාගී වන ලෙසත්, එකී සාකච්ජා වලදී එළඹි තීරණ සම්බන්ධයෙන් මා මගින් ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

03 මෙ සම්බන්ධයෙන් ඔබගේ යටත් ආයතනවල ආයතන ප්‍රධානීන් ද දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ආර්. සී. ද සොයිසා,
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත :- ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, දකුණු පළාත - කරු. දැ.ගැ.ස


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.

பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"